Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# මොරටුව මහා නගර සභාව

## තනතුරු ඇබෑර්තු

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | වැඩ ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය) | 10 | PL 1-2016 | රු. 24,250-10x250 10x270-10x300 12x330- රු. 36,410/- | 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |
| 02. | සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | 10 | PL 1-2016 | රු. 24,250-10x250 10x270-10x300 12x330- රු.36,410/- | 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් ඃ

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවා කාලය (වසරකට ලකුණු 05) | 15 | 50 |
| ක්ෂේත්‍රයට අදාළව ලබාගත් වෙනත් බාහිර පළපුරුද්ද | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම.) | 05 | |
| මුළු ලකුණු | 100 | |

*බඳවා ගැනීමේ කොන්දේසි.-*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
2. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
6. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන අවශ්‍ය සියලුම සුදුසුකම් 2019.09.05 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

7. අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

8. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත්විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

2. බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

3. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කළ පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් 2019.09.05 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

2. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යවනු ලැබූ අයදුම්පත් හා මෙම දැන්වීමේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්‍ර ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ඇත.

3. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. එසේ එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   - උප්පැන්න සහතිකය,
   - අධ්‍යාපන සහතික (ප්‍රතිඵල සනාථ කිරීමේ සහතිකය ඇතුළුව),
   - ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
   - මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)
   - පොලිස් වාර්තාවක්.

4. යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවර වල බහා ඉදිරිපත් කළ යුතුය.

කේ. ඒ. තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2019 ජූලි මස 26 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහනගර සභාවේ.............................................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
3. ස්ථිර ලිපිනය :————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————. දුරකථන අංකය :————.

6. උපන් දිනය ඃ අවුරුද්ද :————, මාසය :————, දිනය :————.

7. ජාතිය :————.

8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු :————, මාස :————, දින :————.

9. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද ? :————.

12. අධ්‍යාපන සුදුසුකම් :————.

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.

14. වෙනත් සුදුසුකම් :————.

15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර :

I. දැනට දරන තනතුර :————.
II. අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග :————.
II. එම තනතුරට පත් වූ දිනය :————.

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ..................................................................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ .................................................................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත්, ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.